සැ. යු. - 2012.08.10 දින පළ වූ අංක 1,771 දරන ගැසට් පත්‍රයේ I :III කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,772 - 2012 අගෝස්තු 17 වැනි සිකුරාදා - 2012.08.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1350 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1358 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 සැප්තැම්බර් මස 07 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 අගෝස්තු මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2012 ජූනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව

මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ දැනටමත් පුරප්පාඩු වී ඇති පහත සඳහන් ප්‍රාථමික (ශිල්පීය නොවන) තනතුරු සඳහා බඳවා ගැනීමට සභා බල ප්‍රදේශයේ පදිංචි සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. සෞඛ්‍ය කම්කරු - 111 වැනි පන්තිය
2. මුරකරු - 111 වැනි පන්තිය

02. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට අයත් වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (IV) හි PL 1-2006 -A අනුව රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 (මෙම වැටුප් ක්‍රමයේ හතරවැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි).

*03. බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

03.1 සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු යි.

03.2 අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පූර්වාසන්න වසර 03ක ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.

පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා ප්‍රමාණවත් සුදුස්සන් බල ප්‍රදේශය තුළ නොමැති වූ විටෙක පමණක් යාබද පළාත් පාලන බල ප්‍රදේශයන්හි අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු ඇත.

03.3 අයදුම්පත්‍ර භාරගන්නා දිනට අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු යි. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනටමත් සේවයේ නියුතු අය සම්බන්ධයෙන් මෙම උපරිම වයස බල නොපානු ඇත.).

03.4. සියලුම අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතු ය.

*04. සේවා නියුක්ති කරවීමේ කොන්දේසි :*

04.1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය.

04.2 වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.

04.3 පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. පරිවාස කාලය අවසානයේ දී වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක තැනැත්තන්ගේ පත්වීම ස්ථිර කිරීම සඳහා සලකා බලනු ලැබේ.

04.5 2007.05.28 දිනැති 07/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව සේවයට බැඳී වසර 05ක් ඇතුළත සේවයට බැඳුන භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් ලබාගත යුතු ය. මේ සඳහා සභාවේ ලේකම්වරයා විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයකින් සමත්විය යුතු ය.

04.6 මෙහි සඳහන් කර ඇති බඳවා ගැනීමේ කොන්දේසි, මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ (පළාත් පාලන ආයතනවල) කාර්යාල කාර්ය සේවයේ ප්‍රාථමික (ශිල්පීය නොවන) සේවා ව්‍යවස්ථාව හා ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසිවලට අමතරව රජය, පළාත් සභාව, සභාවේ ලේකම්වරයා විසින් නිකුත් කරන නියෝග ද, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද මෙම පත්වීම යටත් ය.

*05. බඳවා ගැනීමේ සුදුසුකම් :*

05.1 සෞඛ්‍ය කම්කරු - 111 වැනි පන්තිය

අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරන ලද පාසලක 8 වැනි ශ්‍රේණියට (9 වසරට) නියමිත විෂය නිර්දේශය සම්පූර්ණ කර තිබීම.

05.2 මුරකරු - 111 වැනි පන්තිය

දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමඟ අවම වශයෙන් විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබිය යුතු ය.

*06. කාර්යක්ෂමතා කඩඉම් :-*

බඳවා ගැනීමේ පන්තියට නියමිත වැටුප් පරිමාණයේ හතරවැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

*07. බඳවා ගැනීමේ ක්‍රමය :-*

07.1. අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට යොමු කරනු ලැබේ.

සුදුසුකම් ලත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය ඉදිරියේදී දැනුම් දෙනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණයට පහත සඳහන් ලිපිලේඛන හා ඒවායේ ඡායාස්ථ පිටපත් ඉදිරිපත් කළ යුතුය :-

(i) උප්පැන්න සහතිකයේ මුල් පිටපත ,
(ii) අදාළ අධ්‍යාපන සහතිකයේ මුල්පිටපත/විදුහලේ අස්වීමේ සහතිකය ,
(iii) මෑතක දී ලබාගත් ග්‍රාම සේවක සහතිකය ,
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් ,
(v) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික,
(vi) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

07.2 සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයදුම්කරුවන් අතරින් වඩාත්ම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තෝරාගෙන තනතුරු පුරප්පාඩු බඳවා ගනු ලැබේ.

07.3 මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ දැනට තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

08. *අයදුම් කළ යුතු ආකාරය :*

08.1 එක් අයදුම්කරුවෙකුට අයදුම් කළ හැක්කේ එක් තනතුරක් සඳහා පමණි.

08.2 නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත පරිදි ඒ4 ප්‍රමාණයේ කොළයක දෙපැත්තම භාවිත කර සකස් කරන ලද අයදුම්පතක් 2012.09.28 දින හෝ ඊට පෙර "ලේකම්, මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව, අම්පිටිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. (අයදුම්පත පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.).

08.3 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ" මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම" යන්න සඳහන් කළ යුතු ය.

08.4 අසම්පූර්ණව හෝ නියමිත දිනය පසු වී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08.5 අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු , හෝ වාර්ෂික වැටුප රු. 2.40,360ක් හෝ ඊට වැඩි රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

08.6 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.

09. බඳවාගනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලේකම් වරයා විසින් නිශ්චය කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන කාලය අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය ලේකම්වරයා සතු ය.

එස්. ආර්. අතාවුද,
ලේකම්,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව,
අම්පිටිය.

2012 ජූලි මස 20 වැනි දින,
මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ දී ය.

*ආදර්ශ අයදුම්පත*

**මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව**

***මුරකරු/සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා අයදුම් කිරීම***

අංකය [ ]
කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

01. 1.1 මුලකුරු සමඟ නම :————————,
1.2 මුලකුරුවලින් හැඳින්වෙන නම් :————————,
02. 2.1 ස්ථිර ලිපිනය :————————,
2.2 දැනට රාජ්‍ය සේවයේ නිරත වූවෙකු නම් කාර්යාලයීය ලිපිනය :————————,
03. 3.1 උපන් දිනය:————————,
3.2 2012.09.28 දිනට වයස : අවු:————————, මාස:————————,දින:————————,

04. ජාතික හැඳුනුම්පත් අංකය:——————————,
05. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————,
06. අධ්‍යාපන සුදුසුකම්:
6.1 අධ්‍යාපනය ලද පාසල :——————————,
6.2 ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් :——————————,
(8 වන ශ්‍රේණියට (9 වසරට) නියමිත විෂය නිර්දේශය සම්පූර්ණ කර තිබේ නම් ඒ බව සඳහන් කරන්න.)
6.3 අ.පොස. සාමාන්‍ය පෙළ) විභාගය :——————————,
(මුරකරු තනතුර සඳහා අයදුම්කරනු ලබන අයදුම්කරුවන් අනිවාර්යයෙන් මෙම කොටස සම්පූර්ණ කළ යුතුය.)
වසර :——————————, විභාග අංකය :——————————,

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

6.4 අ.පොස. (උසස් පෙළ) විභාගය :——————————,
(මෙම කොටස සම්පූර්ණ කිරීම අත්‍යවශ්‍ය නොවේ. සමත්ව තිබේනම් පමණක් සම්පූර්ණ කරන්න)
වසර :——————————, විභාග අංකය :——————————,

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

07. වෙනත් සුදුසුකම් :——————————,
08. සේවා පළපුරුද්ද :——————————,

අයදුම්කරුගේ ප්‍රකාශය

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත්, මම දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : 2012——————————,

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................................ මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු අද දින මා ඉදිරිපිටදී ඔහුගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

——————————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය : 2012——————————,
සහතික කරන්නාගේ සම්පූර්ණ නම :——————————,
තනතුර :——————————,
ලිපිනය :——————————,

10. රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයෙහි නියුතු අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතුය.

මෙම ඉල්ලුම්කරු වන ................................................ මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ........................................... වශයෙන් සේවය කරයි. පසුගිය වසර කිහිපය තුළ ඔහු මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහ ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා මුදා හැරිය හැකි බවත් සහතික කරමි.

——————————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය : 2012——————————.

08-441

## මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ වත්තේගම නගර සභාව සඳහා ලොරි රියදුරු/ට්‍රැක්ටර් රියදුරු/පණිවිඩකරු/ජල කම්කරු/විදුලි කම්බිකරු සඳහා බඳවා ගැනීම

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ වත්තේගම නගර සභාවේ පුරප්පාඩුවී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති වත්තේගම නගර සීමාව තුළ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කළ ඉල්ලුම්පත් 2012.08.31 දිනට පෙර "ලේකම්, වත්තේගම නගර සභාව, වත්තේගම" යන ලිපිනයට ලැබෙන පරිදි ලියාදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ ඉහළ කොටසේ වත්තේගම නගර සභාවේ ඉල්ලුම්කරන තනතුර සඳහන් කළ යුතුය. (වත්තේගම නගර සභාවේ දැනටමත් සේවයේ නියුතු ස්ථිර, ආදේශක සේවකයින්ට ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.)

| තනතුරු නාමය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|
| රියදුරු III පන්තිය (ලොරි රථ) | 01 | 06./2006 iv-PL3<br>රු.12,470-130x10-145x10-160x10-170,x12-රු. 18,860 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පොස. (සා.පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබීම;<br><br>මෝටර්රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කර ලද රිය පැදවීමේ නිපුණතාවය පිළිබඳ බලපත්‍රය C,C1,D,D1 කාණ්ඩ සඳහා ලබා තිබීම;<br><br>හා<br><br>දිවා හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් යෝග්‍ය තත්ත්වයෙන් සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය;<br><br>අවම උස අඟල් 62.5ක් විය යුතුය. |
| රියදුරු III පන්තිය (ට්‍රැක්රථ) | 02 | 06./2006 iv-PL3<br>රු.12,470-130x10-145x10-160x10-170x12 රු. 18,860 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පොස. (සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබීම;<br><br>මෝටර්රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද රිය පැදවීමේ නිපුණතාවය පිළිබඳ බලපත්‍රය C,C1,D,D1 කාණ්ඩ සඳහා ලබා තිබිය යුතුය;<br>හා<br>දිවා හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදී සිටීම පිණිස ශාරීරික වශයෙන් යෝග්‍ය තත්ත්වයෙන් සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය;<br><br>අවම උස අඟල් 62.5ක් විය යුතුය. |
| විදුලි කම්බිකරු | 01 | 06./2006 iv-PL1<br>රු.11,730-120x10-130x10-145x10-160x12-රු.17,600 | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව හා ගණිතය සමග විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතුය. වෘත්තීය පිළිබඳ ශිල්පීය සහතික ලබා ඇති අයදුම්රුවන් කෙරෙහි සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| කාර්යාල සේවක සේවය III (පණිවිඩකරු) | 01 | 06./2006 iv-PL1<br>රු.11,730-120x10 -130x10-145x10-160x12-රු.17,600 | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව හා ගණිතය සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතු ය. |
| කාර්යාල සේවක සේවය III (ජල කම්කරු) | 01 | 06./2006 iv-PL1<br>රු.11,730-120x10-130x10-145x10-160x12-රු.17,600 | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව හ ගණිතය සමග විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතු ය. |

*රියැදුරන් බඳවා ගැනීමේ ක්‍රමය :*

1. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය.
2. ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන්නාවූ අයදුම්කරුවන් පත් කිරීමට පෙර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් මෝටර් වාහන පරීක්ෂකවරයෙකු හා පොලිස් රථ ප්‍රවාහන අංශයේ නිලධාරියෙකුගෙන් ද, එක් මාණ්ඩලික නිලධාරියෙකුගෙන් ද, සමන්විත තිදෙනකුට නොඅඩු මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.
3. සේවයට බඳවාගැනීම අදාළ පලාත් පාලන ආයතනයේ පත්වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.
4. රියදුරු III ඛණ්ඩයට බඳවා ගැනීමේදී පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුය. (බඳවා ගන්නා දිනට වසර 03කට පෙර අදාල සහතිකය ලබා සිටිය යුතුය. වාහන පන්තිය C,C1,D සහ D1 හෝ G )

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි*

- මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.
- එසේම රාජ්‍ය සේවා පත්කිරීම් ආදළ වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.
- තෝරාගනු ලබන්නන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර, එම කාලය තුල වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායක තත්ත්වයක නොමැති වුවහොත් ඉවත් කරනු ලැබේ.
- දිවා කාලයේදී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක් තිබිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.

*වෙනත් පොදු කොන්දේසි :*

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වත්තේගම නගර සීමාව තුල යටත් පිරිසෙයින් වසර 03කට නොඅඩු කාලයක් ස්ථිර පදිංචිය ඇති අයෙක් විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.)
- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)
- අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ශ්‍රී ලාංකික විය යුතු ය.
- විශිෂ්ඨ චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය. තෝරා ගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.
- දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.
- රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතු ය.
- රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට පූර්වාසන්න වන අවුරුදු 05ක කාලය තුළ වරදකට (අවවාද කිරීම හැර) දඬුවමක් ලබා නැත්තා වූ ද, මෙම කාලය තුළ යෙදුණු වැටුප් වර්ධක නිශ්චිත දිනට ලබාගත්තා වූ ද, සතුටුදායක සේවා කාලයක් තිබිය යුතු ය. තෝරාගනු ලැබුවහොත් ඔවුන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට තවදුරටත් දායක විය යුතු ය.
- වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව අයදුම්කරු ත්‍රිවිධ හමුදාව හා ආරක්ෂක සේවයේ නිරත වී සිට විධිමත් පරිදි සේවයෙන් මුදා නොහැරී අය නොවිය යුතු ය.
- මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, මධ්‍යම පළාත් සභාව හෝ වත්තේගම නගර සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.
- මෙම බඳවා ගැනීමේ නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද වත්තේගම නගර සභාවේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.
- දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

*අයදුම්කළ යුතු ආකාරය .-* මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර පහත සඳහන් සහතිකවල ඡායාස්ථ පිටපත් සමග 2012.08.31 දිනට ප්‍රථම මා වෙත ලැබෙන්න සලස්වන්න.

1. උප්පැන්න සහතිකය
2. අධ්‍යාපන සහතිකය හා වෘත්තීය සුදුසුකම් දැක්වෙන සහතික
3. පදිංචිය පිළිබඳව ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ යුතුය.)
4. මෑතකදී ලබාගත් චරිත සහතිකය

ලේකම්,
වත්තේගම නගර සභාව.
වත්තේගම.

2012 ජූලි මස 23 වැනි දින දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**
**වත්තේගම නගර සභාව**

***............................................ තනතුර සඳහා වන ආදර්ශ අයදුම්පත්‍රය***

01. මුලකුරු සමග නම :—————.
මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————.
02. ස්ථිර ලිපිනය :—————.
03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————.
04. ජාතික හැඳුනුම්පත් අංකය :—————.
05. උපන් දිනය: වර්ෂය:—————. මාසය:—————. දිනය :—————.
06. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :—————.
07. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.
08. විවාහක/අවිවාහක බව :—————.
09. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උපතින් ද ලියාපදිංචිවීමෙන් ද යන වග :—————.
10. අධ්‍යාපන සුදුසුකම්(සහතිකවල පිටපත් ඇමිනිය යුතුය.) :—————.
අ.පො.ස. (සා. පෙළ) විභාගය
සමත් වර්ෂය :—————. විභාග අංකය :—————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| *1.* | | *5.* | |
| *2.* | | *6.* | |
| *3.* | | *7.* | |
| *4.* | | *8.* | |

11. (1) වෙනත් අධ්‍යාපන සුදුසුකම් :—————.
(2) වෘත්තීය සුදුසුකම් :—————.
(3) සේවා පළපුරුද්ද :—————.
12. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවය නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුර :—————.
ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් /ආදේශක යන වග ද :—————.
එම තනතුරට පත්වූ දිනය :—————.

13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන ............................................ මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

—————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :—————.
(නිල මුද්‍රාව තැබිය යුතුය.)

08-466

## හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා සීමාව තුළ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|
| සෞඛ්‍ය කම්කරු | 01 | රු.11,730-10x120-10x130-10x145-12x160- රු.17,600 රා. ප. ච. ලේ. 6/2006(iv) PL-1-2006-A වැටුප් පරිමාණයේ 01 වැනි පියවර ආරම්භක වැටුප් පියවර වශයෙන් සැලකේ. (4 වැනි වැටුප පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | අවම වශයෙන් 8 ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම. |

*02. අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

1. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු අතර පුරුෂ පක්ෂයෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ ස්ථිර/අනියම් තනතුරු දරන සේවකයන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.
2. අයදුම්කරු හාරිස්පත්තුව බල ප්‍රදේශය තුල යටත් පිරිසෙයින් අවුරුදු 03ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුය.
3. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
4. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙක් වී දඬුවම් ලැබුවෙක් නොවිය යුතුය.
5. රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහකරනු ලැබූ හෝ රා.ප.චලේ.44/90 යටතේ විශ්‍රාම ලැබූ අයෙකු නොවිය යුතුය.
6. හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ දැනට ආදේශක පදනම මත සේවය කරන සේවකයන්ට විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

*03. සේවා කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය ;
2. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
3. තෝරාගනු ලබන සේවකයින් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.
4. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි හා මුදල් රෙගුලාසිවලට ද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවය හෝ රජයේ දෙපාර්තමේන්තු හෝ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :*

මෙහි පහත සඳහන් කර ඇති ආදර්ශ ආකෘතිය පරිදි 12X8 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත් සකස් කර 2012.08.17 දිනට පෙර "ලේකම්, හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව, බිරිගම, වැරැල්ලගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. කවරයේ වම්පස උඩ කෙළවරේ "සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව එවනු ලබන අයදුම්පත්‍ර හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*04. අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කල පිටපත් එවිය යුතුවේ :*

01. උප්පැන්න සහතිකය ;
02. අධ්‍යාපන සහතික ;
03. පදිංචිය සහතික කිරීමේ සහතිකය;
04. මැතක දී ලබාගත් ග්‍රාම සේවා සහතිකය ;
05. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්;
06. වෙනත් සුදුසුකම් දැක්වෙන සහතිකය
07. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික

05. *බඳවා ගැනීමේ ක්‍රමය :*

1. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට හා ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනයකර ලකුණු ප්‍රමුඛතාවය මත සුදුසුකම් ලබන අයදුම්කරුවන් සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

2. මෙම අයදුම්පත් කැඳවූ පසු හෝ කැඳවන අතරතුර දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීමේ බලය හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

ඩී. ජී. එම්. බී. රණසිංහ,
ලේකම්,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

2012 ජූලි මස 24 වැනි දින,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව,
බරිගම, වැරැල්ලගම දීය.

*ආදර්ශ අයදුම්පත්‍රය*
*හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව*

*සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————————,
02. තැපැල් ලිපිනය :——————————,
03. උපන් දිනය: අවුරුද්ද:——————————, මාසය:——————————,දිනය:——————————,
04. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු:——————————, මාස:——————————,දින:——————————,
05. ස්ත්‍රී/පුරුෂභාවය:——————————,
06. විවාහක /අවිවාහක බව:——————————,
07. ජාතික හැඳුනුම්පත් අංකය:——————————,
08. ජාතිය :——————————,
09. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද/එසේ නම් :——————————,
පරම්පරාවෙන්ද/ලියාපදිංචි වීමෙන්ද යන වග :——————————,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කාලය :——————————,
10. අධ්‍යාපන සුදුසුකම්:
වර්ෂය :——————————,

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

11. සේවා පළපුරුද්ද :——————————,
12. වෙනත් සුදුසුකම් :——————————,
13. ඔබ යම්කිසි වරදකට හෝ කෙදිනක හෝ උසාවියක දී වැරදිකරුවී ඇත්නම් ලැබූ දඬුවම් පිළිබඳ විස්තර සඳහන් කරන්න :————. ,

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් නුසුදුස්සෙකු බවට පත්වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් සේවයෙන් පහකරනු ලැබීමට සිදුවන බවත් දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————,

08-460

# පළාත් පාලන නිවේදන

## මහරගම නගර සභාව

නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය) 50 හා 52 වන වගන්තිය ප්‍රකාර කරනු ලබන දැන්වීම

නගර සභා ආඥාපනතේ 255 වන අධිකාරියේ 50 හා 52 වන වගන්ති ප්‍රකාර බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහරගම නගර සභා සීමාවේ පිහිටි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් මහරගම නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට මහ සභාව තීරණය කර ඇත.

02. මේ පිළිබඳව පොදු ජනතාව හෝ අදාල දේපළ හිමියන් විසින් විරුද්ධත්වයක් දක්වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට එක් මාසයක් ඇතුලත ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය.

03. මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් මෙම උප ලේඛනයේ සඳහන් පාරවල් මහරගම නගර සභාව සතු පාරවල් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

කාන්ති කොඩිකාර,
සභාපති,
මහරගම නගර සභාව.

2012 ජූලි මස 20 වැනි දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *පාරේ නම* | *විස්තරය* | *ආරම්භය (වරිපනම් අංකය)* | *අවසානය (වරිපනම් අංකය)* | *දිග (අඩි)* | *පළල (අඩි)* |
|---|---|---|---|---|---|
| පන්නිපිටිය දෙපානම අරලිය උයන අංක 60/21, 60/15, 60/23, 60/24, 75/25 යන නිවාස පිහිටි අතුරු මාර්ගය | මෙරායා සමරනායක මිනින්දෝරු තැන විසින් 1998 ජූලි මස 29 දින අඳින ලද අංක 6095 දරන මිනින්දෝරු සැලැස්ම මගින් දැක්වෙන මාර්ගය | 60/21 | 75/25 | 80 | 10 |

08-497

---

## සූරියවැව ප්‍රාදේශීය සභාව

සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 සිට 126 දක්වා වූ වගන්ති වලින් 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2(3) වගන්තියෙන් පනවා ගැනීමට ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර බලය ලැබෙන්නාවූ 1952 අංක 06 පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියෙන් පළාත් පාලන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව ඔහු විසින් සම්පාදනය කර, අංක 520/7 හා 1988.8.23 දින ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූ දකුණු පළාත් සභාව විසින් අනුමත කර ඒ බව අංක 46 හා 1990.10.21 දින දරන ගැසට් පත්‍රයේ නිවේදනයක් මගින් පිළිගනු ලැබූවාවූ ද, සම්මත අතුරු ව්‍යවස්ථා 01 සිට 42 දක්වා වූ කාණ්ඩ මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවෙන දින සිට වලංගුවනසේ පිළිගැනීමට සූරියවැව ප්‍රාදේශීය සභාවේ 2012.06.28 දින පැවැත්වූ සභා රැස්වීමේදී සම්මත වූ අංක 6 :1 දරන යෝජනාව මගින් තීරණය වී ඇති බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. ඒ. සුජිත් මුතුකුමාරණ,
සභාපති,
සූරියවැව ප්‍රාදේශීය සභාව.

2012 ජූලි මස 24 වැනි දින,

08-526

---

## ත්‍රිකුණාමලය නගර සභාව

නගර සභා ආඥා පනත (255 පරිච්ඡේදය)

නගර සභා ආඥා පනත 255 44(2) වන පරිච්ඡේදයට ප්‍රකාරව පහත සඳහන් වගුව මගින් විස්තර කර ඇති නගර සභාවට අයත් පොදු මාර්ග මෙමගින් පළ කරනු ලබයි.

ත්‍රිකුණාමලය නගර සභා බල සීමාව තුළ පිහිටි සහ පහත සඳහන් වන වගුවෙහි පෙන්වා දී ඇති මෙම පොදු මාර්ගය නගර සභාවට අයත් වන බව ද සංවර්ධනය කිරීමට නිගමනය කර ඇති බව ද මෙමගින් වැඩිදුරටත් දැනුම් දෙනු ලැබේ.

කේ. සෙල්වරාජා මහතා,
සභාපති,
නගර සභාව, ත්‍රිකුණාමලය.

2012 ජූලි මස 25 වැනි දින,

වගුව

| *අනු අංකය* | *වීදිය* | *වීදියේ ආරම්භය සහ අවසානය* | *වීදියෙ දිග* | *වීදියේ සීමාව* |
|---|---|---|---|---|
| 01 | ප්‍රධාන පාර | ඩොක්යාර්ඩ් පාර<br>තිරුඥාණ සම්බන්ධර් වීදිය | 960m | පාර මැද සිට අඩි 25 |

08-462

---

## කිරින්ද - පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 “2” වගන්තිය යටතේ කරන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය ප්‍රකාර දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙසේ ප්‍රකාශයට පත් කරනු ලබන මංමාවත් ලකුණු කරනු ලැබ ඇත්තේ යම් ඉඩමක් හරහා ද, එම ඉඩමේ අයිතිකරුවන් ලෙස හිමිකම් පාන යම් පාර්ශ්වයක් විසින් කිසියම් විරෝධයක් පළ කරනු ලබන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දින සිට එක් මසක් ඇතුළත අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 “2” වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙමි.

03. ඉහත කාලසීමාව තුළ මෙම නිවේදනයේ සඳහන් මංමාවත් පිළිබඳව කිසියම් විරෝධතාවයක් ඉදිරිපත් නොකළහොත්, මෙහි සඳහන් මංමාවත් කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව සතු පොදු මංමාවත් වශයෙන් පාලනය කරනු ලබන බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

සනත් හෙට්ටිආරච්චි,
සභාපති,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව.

2012 ජූලි මස 25 වැනි දින,
කිරින්ද පුහුල්වැල්ල,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *ග්‍රාම නිලධාරි වසම* | *ආරම්භය* | *අවසානය* | *වම්පස ඉඩම* | *දකුණු පස ඉඩම* | *පාරේ දිග* | *පාරේ පළල අඩි* |
|---|---|---|---|---|---|---|---|---|
| 1. | පුහුල්වැල්ල දේවාලමුල්ල මාර්ගයේ පොල්ගස් හතර ළඟ සිට අලුත් ගෙදර දක්වා මාර්ගය | පුහුල්වැල්ල නැගෙනහිර | පුහුල්වැල්ල දේවාලමුල්ලේ කම්මලය වත්ත ඉඩම අසලින් | අළුත්ගෙදරවත්ත ඉඩම | 1. ගොඩගේ වත්ත<br>2. හකුරන්තෙ කනත්ත | කම්මලේවත්ත | 200 m | 16 |
| 2. | දම්මණ්ඩිය සහ යකදුරුරුප්ප පාර | පුහුල්වැල්ල බටහිර | සමගි මාවතේ අලකොළදෙණිය දම්මණ්ඩිය ඉඩම අසලින් | යකදුරුරුප්ප ඉඩම් අවසානය | 1. අලකොළදෙණිය ඉඩම<br>2. යකදුරුරුප්ප ඉඩම | 1. අළකොළදෙණිය<br>2. යකදුරුරුප්ප | 100 m | 13 |
| 3. | බොරළුකැටියහේන පාර | හෙට්ටියාවල නැගෙනහිර | කොළඹහේන අම්බලගෙදර පාරේ කොළඹ හේන ඉඩම අසලින් | මොදරවානහේන ඉඩම | 1. මාරගාහේන<br>2. බොරළුකැටිය හේන | 1. කොළඹහේන<br>2. මොදරවානහේන | 200 m | 10 |

| අනු. අංකය | මාර්ගයේ නම | ග්‍රාම නිලධාරී වසම | ආරම්භය | අවසානය | වම්පස ඉඩම | දකුණු පස ඉඩම | පාරේ දිග | පාරේ පළල අඩි |
|---|---|---|---|---|---|---|---|---|
| 4. | දොළගාවහේන සිට ජුල්ගහ කොරටුව දක්වා මාර්ගය | හෙට්ටියාවල දකුණ | කිරින්ද හීල්ලකන්ද පාරේ දොළගාව හේන ඉඩම අසලින් | ජුල්ගහකොරටුව ඉඩම | 1. උඩහගෙදර 2. මැදවත්ත | 1. දොළගාවහේන 2. මැදවත්ත | 350 m | 10 |
| 5. | කරතොට ගැටමාන්න පාරේ දෙවන පටුමග | කරතොට | කරතොට ගැටමාන්න පාරේ අගලබඩ කුඹුර අසලින් | තිබ්බොටු කොරටුව ඉඩම | 1. අගලබඩ කුඹුර 2. තිබ්බොටු කොරටුව | 1. අගලබඩකුඹුර 2. තිබ්බොටු කොරටුව | 95 m | 10 |
| 6. | ධර්මාරාම මාවතේ දෙවන පටුමග | කරතොට | ධර්මාරාම මාවතේ කිරිමඩුහේන අසලින් | මැදගොඩ ඉඩම | 1. කොච්චිකුරුප්ප 2. කිරිමඩුහේන 3. පලුගොඩවත්ත 4. එගොඩවත්ත | 1. කිරිමඩුහේන 2. එගොඩවත්ත | 160 m | 10 |
| 7. | රිටිගහවතුගොඩට යන පාර | හෙට්ටියාවල බටහිර | කිරින්ද ගැටමාන්න මාර්ගයේ ළිඳගාවදෙණිය ළිඳ අසලින් | රිටිගහවත්ත ඉඩම | මුත්තන්තිරිය දෙණිය කුඹුර | පහල මුත්තන්තිරිය දෙණිය කුඹුර | 130 m | 10 |
| 8. | බදුවත්ත පාර | හෙට්ටියාවල බටහිර | කිරින්ද ගැටමාන්න මාර්ගයේ 2 කණුව අසලින් | බදුවත්ත ඉඩම | බදුවත්ත ඉඩමේ ඉඩම් කැබලි කිහිපයක් | බදුවත්ත ඉඩමේ ඉඩම් කැබැලි කිහිපයක් | 125 m | 12 |
| 9. | 13 කණුව, උඩහ එගොඩහවත්ත මාර්ගය | ගල්කන්ද | එගොඩහවත්ත සෙරමික් මාර්ගයේ එගොඩහවත්ත ඉඩම අසලින් | උඩහ එගොඩහවත්ත ඉඩම | 1. කනත්තෙ ගෙදර 2. උඩහඅට්ටික්කගහ ගෙදර 3. පාටිගෙවත්ත 4. උඩහ එගොඩහවත්ත | එගොඩහවත්ත | 150 m | 12 |
| 10. | මැදදෙණිය කුඹුර හරහා නයිදමුලහේන 1 වන පටුමග | පුහුල්වැල්ල බටහිර | නයිදමලහේන පාරේ මැදදෙණිය කුඹුර අසලින් | නො. 04 ඉඩම | 1. නො. 04 ඉඩම 2. නො. 04 සහන් නිවස ඉඩම | නො. 07 ඉඩම | 80 m | 12 |
| 11. | අලකොළදෙණිය දම්මණ්ඩිය පාර | පුහුල්වැල්ල බටහිර | දේවාලමුල්ල සමගි මාවත | යකදුරු රුප්ප ඉඩම | 1. අලකොළදෙණිය දම්මණ්ඩිය ඉඩමේ කැබලි 2. යකදුරුරුප්ප ඉඩමේ කැබලි | අලකොළදෙණිය දම්මණ්ඩිය ඉඩමේ කැබලි | 100 m | 12 |
| 12. | නාරද්දෙගෙදර පාර | කිරින්ද මගින් ඉහල උතුර | මාතර හක්මණ පාරේ මධුසර පන්තිය අසලින් | නාරද්දෙ ගෙදර ඉඩම | 1. ඇදිරි ගොඩැල්ල 2. නාරද්දෙ ගෙදර 3. පරණවත්ත | ගම්හේවත්ත | 120 m | 12 |
| 13. | ආඩිගෙවත්ත පාර | කිරින්ද මගින් ඉහළ මධ්‍යම | පුවක්ගහමඩිත්ත ආරණ්‍ය පාරේ ආඩිගෙවත්ත ඉඩම අසලින් | බෝගහලන්ද ඉඩම | 1. ආඩිගෙවත්ත ඉඩමේ කැබලි කිහිපයක් 2.බෝගහලන්ද ඉඩමේ කැබලි කිහිපයක් | ආඩිගෙවත්ත ඉඩමේ කැබලි කිහිපයක් | 150 m | 08 |
| 14. | වැලිවත්ත පාර | කරතොට | කරතොට හෙට්ටියාවල මාර්ගයේ කහඹිලියාහේන ඉඩම අසලින් | වැලිවත්ත ඉඩම | 1. කහඹිලියහේන 2. සුදම්පෙගෙරුප්ප 3. වැලිවත්ත ඉඩමේ කැබලි කිහිපයක් | 1. සුදම්පෙගෙරුප්ප 2. වැලිවත්ත ඉඩමේ කැබලි කිහිපයක් | 175 m | 12 |

| අනු. අංකය | මාර්ගයේ නම | ග්‍රාම නිලධාරි වසම | ආරම්භය | අවසානය | වම්පස ඉඩම | දකුණු පස ඉඩම | පාරේ දිග | පාරේ පළල අඩි |
|---|---|---|---|---|---|---|---|---|
| 15. | මහ බදුවත්ත පාර | හෙට්ටියාවල දකුණ | කිරින්ද ගැටමාන්න පාරේ කඩවැද්දුවගොඩ ගෙදර වත්ත ඉඩම අසලින් | මහබදුවත්ත ඉඩම | 1. ජුලිගහකොරටුව<br>2. කඩවැද්දුවගොඩ ගෙදර වත්ත | කඩවැද්දුවගොඩ ගෙදරවත්ත | 100 m | 12 |
| 16. | තන්තිරිගෙවත්ත පාර | ඕවිටිගමුව උතුර 328ජී | හපුවච්චිගෙවත්ත අලහේන්පිට අතුරු මාර්ගයේ පරණ වත්ත ඉඩම අසලින් | වෙදගෙදර ඉඩම | 1. පරණවත්ත<br>2. කණුකැටි කුඹුර | 1. වන්නිගෙ අරඹ<br>2. පාවුලවත්ත<br>3. කණුකැටි කුඹුර<br>4. කණුකැටි ගොඩැල්ල | 300 m | 16 |
| 17. | නවෝදය මාවත | 325සී කිරින්ද මගින් ඉහල නැගෙනහිර | කිරින්ද-හීල්ලකන්ද මාර්ගයේ ලාවල්ල ගහ කොරටුව ඉඩම අසලින් | හොරගහකනත්ත ඉඩම | 1. ලාවල්ල ගහ කොරටුව<br>2. හොරගහ කනත්ත | 1. ලාවල්ල ගහ කොරටුව<br>2. හොරගහකනත්ත | 105 m | 12 |
| 18. | ඉසුරු මාවත | 325එච් වවුලන්බොක්ක | කිරින්ද ගැටමාන්න පාරේ ගල්කැටියවත්ත ඉඩම අසලින් | ගල්කැටියවත්ත ඉඩම | ගල්කැටියවත්ත | ගල්කැටියවත්ත ඉඩමේ කැබලි කිහිපයක් | 75 m | 12 |
| 19. | කටුඉඹුල්ගහ කොරටුව පාර | පුහුල්වැල්ල බටහිර 326ඩී | දේවාලමුල්ල ඕවිටිගමුව මාර්ගයේ රිටිගහවත්ත ඉඩම අසලින් | නිල්පැල ගහ කොරටුව | 1. පිල්ලෑව ඉඩම<br>2. කටු ඉඹුල්ගහ කොරටුව | 1. රිටිගහවත්ත ඉඩම<br>2. කටුඉඹුල් ගහ කොරටුව | 100 m | 10 |
| 20. | කලුගල්මුල්ලෙ ගෙදර වත්ත පාර | කිරින්ද මගින් පහළ 326 | කිරින්ද කඹුරු පිටිය පාරේ කලුගල් මුල්ලෙ ගෙදර වත්තේ ඉඩමේ අංක 09 කැබැල්ල අසලින් | කලුගල්මුල්ලෙ ගෙදරවත්ත ඉඩමේ අංක 01 දරන කැබැල්ල | කළුගල්මුල්ලෙ ගෙදරවත්ත ඉඩමේ කැබලි කිහිපයක් | කළුගල්මුල්ලෙ ගෙදරවත්ත ඉඩමේ කැබලි කිහිපයක් | 100 m | 15 |
| 21. | ගල්කැටිදෙණිය අතුරු මාර්ගය | ඕවිටිගමුව උතුර | ඕටිවිගමුව අලුහේන්පිට පාරේ ගල්කැටි දෙණිය කඩේ අසලින් | කොඩිවත්ත ඉඩම | හකුරන්ගෙවත්ත | ගල්කැටිදෙණිය අත්මග | 250 m | 12 |
| 22. | හිත්තැටියගෙවත්ත පාර | ඕවිටිගමුව දකුණ | ඕවිටිගමුව දේවාලමුල්ල මාර්ගයේ බදුවත්ත කඩේ අසලින් | දෙල්ගහහේන ඉඩම | 1. බදුවත්ත අම්බලම ගාව වත්ත<br>2. හිත්තැටියගෙවත්ත | 1. බදුවත්ත අම්බලමගාවත්ත<br>2. හිත්තැටියගෙවත්ත<br>3. තන්තිරිගෙවත්ත | 50 m | 12 |
| 23. | වියන්ගොඩගවත්ත මාර්ගය | 328 ඕවිටිගමුව දකුණ | ඕවිටිගමුව දේවාලමුල්ල පාර වියන්ගොඩහ වත්ත ඉඩම අසලින් | වියන්ගොඩගවත්ත ඉඩම | වියන්ගොඩගවත්ත | වියන්ගොඩගවත්ත | 50 m | 12 |

| අනු. අංකය | මාර්ගයේ නම | ග්‍රාම නිලධාරී වසම | ආරම්භය | අවසානය | වම්පස ඉඩම | දකුණු පස ඉඩම | පාරේ දිග | පාරේ පළල අඩි |
|---|---|---|---|---|---|---|---|---|
| 24. | බුලත්වැලකොරටුව පාර | 325සී කිරින්ද මගින් ඉහල නැගෙනහිර | කිරින්ද-ගැටමාන්න ප්‍රධාන පාරේ 01 කණුව අසලින් | දොඩම්පඳුරහේන ඉඩම | 1. උඩහ කඩේගෙදරවත්ත<br>2. අරඹෙවත්ත<br>3. මූකලන්ගෙදරවත්ත<br>4. උඩහ කොරටුව<br>5. කොටිගලහේන | 1. උපාසකගෙදර වත්ත<br>2. බුලත්වැලකොරටුව<br>3. උඩහකොරටුව<br>4. දොඩම්පඳුරහේන | 500m | 12 |
| 25. | සමගි මාවත | ඕවිටිගමුව දකුණ | උල්ලල කරපුටු ගල මාර්ගයේ වැලිපොතහේන අසලින් | ඩී. එම්. දයාවතීගේ ඉඩම | 1. වැලිපොතහේන<br>2. ලීලාංගන මයාගේ ඉඩම<br>3. ධර්මසේන සුදුසිංහ මයාගේ ඉඩම<br>4. ජී. ජී. ප්‍රේමදාස මයාගේ ඉඩම | 1. වැලිපතහේන<br>2. නිල්මිණී මියගේ ඉඩම<br>3. එච්. එම්. සරනේලිස් මයාගේ ඉඩම | 600 m | 12 |
| 26. | බෙරුවලගේ වත්ත මාර්ගය | 326සී මල්වතුගොඩ | කිරින්ද කඹුරු පිටිය මාර්ගයේ ඉඹුල්ගහවත්ත නොහොත් කටුඉඹුල්ගහ වත්ත ඉඩම අසලින් | කේ. ඒ. සාමෙල් මයාගේ ඉඩම | ඉඹුල්ගහවත්ත නොහොත් කටුඉඹුල්ගහ වත්ත ඉඩම (කැබලි අංක 03) | කටුඉඹුල්ගහවත්ත ඉඩම (කැබලි අංක 04) | 50 m | 12 |
| 27. | පුවක්වත්ත පාර | 326 සී මල්වතුගොඩ | කිරින්ද-කඹුරු පිටිය ප්‍රධාන මාර්ගයේ උස්වත්ත ඉඩම අසලින් | පුවක්වත්ත ඉඩම | උස්වත්ත ඉඩම | 1. පාලුවත්ත ඉඩම<br>2. එගොඩවත්ත ඉඩම | 55 m | 10 |
| 28. | ශ්‍රී බුද්ධ ජයන්ති මාර්ගය 2 වන හරස් පාර | 326 සී මල්වතුගොඩ | බුද්ධ ජයන්ති මාවතේ වෙහෙර ගහ කොරටුව ඉඩම අසලින් | දිවෙල්වත්ත ඉඩම | 1. වෙහෙරගහ කොරටුව<br>2. දිවෙල්වත්ත<br>3. රුප්ප<br>4. උස්රුප්ප | 1. වෙහෙරගහකොරටුව<br>2. දිවෙල්වත්ත<br>3. උස් රුප්ප | 70 m | 12 |
| 29. | ජම්බුගහහේන මාවත | 328ඒ ඕවිටිගමුව උතුර | 12 කණුව සිට ගල්කන්ද පාරේ කජ්ජුගහහේන ඉඩම අසලින් | ජම්බුගහහේන ඉඩම | 1. කජ්ජුගහහේන<br>2. උස් රුප්ප<br>3. එගොඩහදෙණිය<br>4. බොයිඩර් කොරටුව | 1. හෝන්පල කනත්ත ඉඩම<br>2. මඩවලහේන ඉඩම<br>3. ආවාස කොරටුව ඉඩම<br>4. කිරිමඩුවහේන ඉඩමේ කැබලි කිහිපයක් | 500 m | 12 |
| 30. | තේක්කවත්ත ගම් මැද්දෙගෙ වත්ත පාර | ඕවිටිගමුව දකුණ | දේවාලමුල්ල පාරේ තේක්ක වත්ත ඉඩමේ අංක 20,22 දරන කැබලි අසලින් | ගම්මැද්දෙ ගෙවත්ත ඉඩම | 1. ගම්මැද්දෙගෙ වත්ත ඉඩම<br>2. තේක්කවත්ත අංක 21 කැබැල්ල<br>3. තේක්කවත්ත අංක 22 කැබැල්ල | 1. ගම්මැද්දෙගෙ වත්ත ඉඩම<br>2. තේක්කවත්ත අංක 18 කැබැල්ල<br>3. තේක්කවත්ත අංක 20 කැබැල්ල | 60 m | 12 |
| 31. | මහ ගෙදර පාර | 325 ජී හෙට්ටියාවල උතුර | කරතොට හාල්දොල පාරේ වැව් | කණ්ඩම්බිගෙ පරණ වත්තේ සී අක්ෂරය | 1. හාල්පත්දෙණිය කුඹුර<br>2. කජ්ජුගහදෙණිය | 1. වැව්ලියද්ද කුඹුර<br>2. කණ්ඩම්බිගේ පරණවත්ත සී | 150m | 12 |

| අනු. අංකය | මාර්ගයේ නම | ග්‍රාම නිලධාරි වසම | ආරම්භය | අවසානය | වම්පස ඉඩම | දකුණු පස ඉඩම | පාරේ දිග | පාරේ පළල (අඩි ) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | ලියද්ද කුඹුර හා හාල්පන්දෙණිය කුඹුර අසලින් | දරන කැබැල්ල | කුඹුර 3. කණ්ඩම්බිගෙ ගෙදර වත්ත ඉඩම | අක්ෂරය දරන කැබැල්ල 3. කණ්ඩම්බිගෙ පරණවත්ත ඊ දරන කැබැල්ල | | |
| 32. | මහවත්ත පාර | කිරින්ද මගින් ඉහළ මධ්‍යම | පුවක්ගහමඩිත්ත ආරණ්‍ය පාරේ වඩුගෙදර ඉඩම අසලින් | එම්. එච්. සුනීතා මහත්මියට අයත් වඩුගෙදර ඉඩම | එන්. කේ. ඉන්ද්‍ර සෝම මහතාට අයත් වඩුගෙදර ඉඩම | 1. එම්. එන්. අජිත් මහතාට අයත් වඩුගෙදර ඉඩමෙන් කොටසක් 2. එම්. එච්. සුනීතා මියට අයත් වඩුගෙදර ඉඩමෙන් කොටසක් | 35m | අඩි 12 |
| 33. | තලල්ලේ ගෙදර වත්ත පාර | 325බී කිරින්ද මගින් ඉහළ දකුණ | මාතර-හක්මණ පාරේ 11 කණුව අමුකනත්ත ඉඩම අසලින් | තලල්ලේගෙදර වත්ත ඉඩම | 1. තලල්ලේ ගෙදර වත්ත 2. අළුකැටියවත්ත | 1. තලල්ලේ ගෙදර වත්ත 2. අළුකැටිය වත්ත | 30m | අඩි 10 |
| 34. | පරණ මහ පාර | 325ඊ හෙට්ටියාවල දකුණ | කිරින්ද-ගැට මාන්න පාරේ උඩදෙණිය වත්ත ඉඩම අසලින් | හේනවත්ත ඉඩම | 1. උඩදෙණියවත්ත කැබලි කිහිපයක් 2. මහබදුවත්ත 3. හේනවත්ත | 1. උඩදෙණිය වත්ත 2. උයනගෙවත්ත හෙවත් අරඹගෙවත්ත 3. අරඹගෙවත්ත හෙවත් අපරැක්කෙ ගෙදර 4. ඒනවත්ත | 200m | අඩි 12 |
| 35. | ජාලත්ගේ වත්ත වෙලන්කැටිහේන මාර්ගය | හෙට්ටියාවල බටහිර | ජාලත්ගෙවත්ත කරයල්කනත්ත පාරේ ජාලත්ගෙ වත්ත ඉඩම අසලින් | වෙලන්කැටි හේන ඉඩම | 1. ජාලත්ගෙවත්ත | 1. ජලත්ගෙවත්ත 2. වෙලන්කැටිහේන | 75m | අඩි 12 |
| 36. | පුහුගහහේන පාර | හෙට්ටියාවල උතුර | ශ්‍රී විමලසිරි නාහිමි මාවතේ පුහුගහහේන ඉඩම අසලින් | ඇත් අඩිය හේන ඉඩම | 1. පුහුගහහේන 2. ඇත්අඩිය හේන | 1. පුහුගහහේන 2. ඇත්අඩිය හේන | 75m | අඩි 14 |
| 37. | ලියනගෙදර වත්ත පාර | පුහුල්වැල්ල බටහිර | නයිගල්කන්ද අතුරු මාර්ගයේ ගීමදු පිට්ටනිය වත්ත ඉඩම අසලින් | ලියනගෙදර වත්ත දෙණිය ඉඩම | 1. කැටකාලගහවත්ත නොහොත් ගීමදු පිට්ටනිය වත්ත 2. ලියනගෙදරවත්ත කැබලි කීපයක් | 1. කැටකාලගහ වත්ත නොහොත් ගීමදු පිට්ටනිය වත්ත 2. ලියනගෙදරවත්තේ කැබලි කීපයක් | 150m | අඩි 12 |
| 38. | අරලිය මාවත | කිරින්ද මගින් ඉහළ මධ්‍යම | පුවක්ගහමඩිත්ත ආරණ්‍ය පාරේ පතොක් ගහ කොරටුව ඉඩම අසලින් | බෝගහලන්ද ඉඩම | මහවත්ත | පතොක්ගහ කොරටුව | 55m | අඩි 12 |
| 39. | ජයකොඩිහේන පාර | කිරින්ද මගින් ඉහළ නැගෙනහිර | හීල්ලකන්ද පාරේ ගාල්ලහේන ඉඩම අසලින් | ජයකොඩිහේන ඉඩම | 1. ගාල්ලහේන ඉඩම 2. ජයකොඩිහේන ඉඩම | පන්සල ඉඩම | 120m | අඩි 12 |
| 40. | ගොවි මාවත | කුඹල්ගොඩ | සීලරතන මාවතේ කුඹල්ගොඩ පන්සල අසල | උඩරටේ කුඹුර | 1. දිනුවන් ගොඩහේන 2. බෙරවදෙණිය කුඹුර | 1. අමුතිර කුඹුර 2. තෝරුපිටිය කුඹුර | 1km | අඩි 12 |

| අනු. අංකය | මාර්ගයේ නම | ග්‍රාම නිලධාරී වසම | ආරම්භය | අවසානය | වම්පස ඉඩම | දකුණු පස ඉඩම | පාරේ දිග | පාරේ පළල අඩි |
|---|---|---|---|---|---|---|---|---|
| | | | හතරමං හන්දිය අසලින් | | 3. හාල්පොත්දෙණිය කුඹුර<br>4. ඔවිලන්ගොඩැල්ල<br>5. උඩරටේ කුඹුර | 3. පෝටවල කුඹුර<br>4. මහ කුඹුර<br>5. විදාන කුඹුර | | |
| 41. | අට්ටික්කා ගහ කොරටුව බතලවත්ත දෙණිය පාර | 326 බී ගල්කන්ද | සෙරමික් මාර්ගයේ රුප්පවත්ත ඉඩම අසලින් | අට්ටික්කා ගහ කොරටුව ඉඩම | 1. බතලවත්ත දෙණිය<br>2. අට්ටික්කා ගහ කොරටුව | 1. බතලවත්තදෙණිය<br>2. අට්ටික්කා ගහ කොරටුව | 100m | 12 |
| 42. | මැටිහක්කේ හේන පාර | 328 ඕවිටිගමුව දකුණ | කඹුරුපිටිය-කිරින්ද පාරේ මැටිහක්කේ හේනවත්ත ඉඩම අසලින් | කැබලි අංක 12 මැටිහක්කේ හේනවත්ත ඉඩම | දෙල්ගස්වත්ත ඉඩමේ කැබලි කීපයක් | මැටිහක්කේ හේන වත්ත | 150m | 20 |
| 43. | අළුත්ගෙදර පාර | කුඹල්ගොඩ | නාරද්ද ගොඩ වෙල පාරේ අළුත්ගෙදර ඉඩම අසලින් | අළුත්ගෙදර ඉඩම | දිමියන්ගහවත්ත ඉඩම | අන්දරයස්ගේ ඉඩම | 50m | 12 |
| 44. | ඉහළවත්ත පාර | කිරින්ද මගින් ඉහළ මධ්‍යම | වඩුගෙදරවත්ත පාරේ වඩුගෙදර වත්ත ඉඩම අසලින් | ඉහළහවත්ත ඉඩම | වඩුගෙදරවත්ත ඉඩම | දොස්තරගෙදර නොහොත් මරක්කල වත්ත | 100m | 12 |
| 45. | ගජමංගෙවත්ත මාර්ගය | 325ඊ හෙට්ටියාවල දකුණ | කිරින්ද-ගැටමාන්න මාර්ගයේ බෙලිගස්කොරටුව කඩේ අසලින් | ගජමංගෙවත්ත ඉඩම | 1. මලපලාකොරටුව<br>2. ගජමංගෙවත්ත | 1. බෙලිගස්කොරටුව<br>2. කොරටුව<br>3. ගජමංගේවත්ත කැබලි කීපයක් | 132m | 10 |
| 46. | ඉහළහවත්ත පුහුගහහේන කොරටුව මාර්ගය | ඕවිටිගමුව දකුණ | දේවාලමුල්ල ප්‍රධාන මාර්ගයේ ලියනගේ වත්ත ඉඩම අසලින් | පුහුගහහේන කොරටුව ඉඩම | 1. ඉහළහවත්ත<br>2. ඉහළහවත්තහේන<br>3. ලියනගෙවත්ත<br>4. වෙරළුගහගෙදර ඉඩම | 1. ඉහළවත්ත<br>2. ඉහළවත්තහේන<br>3. වෙරළුගහගෙදර<br>4. ලියනගෙවත්ත | 150m | 12 |
| 47. | මැදකුට්ටිය පාර | ඕවිටිගමුව දකුණ | ඕවිටිගමුව පුරාණ විහාරය අසලින් | මැදකුට්ටිය ඉඩම | පුවක්ගහමඩිත්ත කුඹුරු යාය | මඩවලමුල්ල කුඹුරු යාය | 100m | 12 |
| 48. | පහළදෙණිය මැදහේන මාර්ගය | වතුකොළ කන්ද නැගෙනහිර | වතුකොළකන්ද පාරේ වැලි පොත්හේන ඉඩම අසලින් | මැදහේන ඉඩම | කුඹුරු රක්ෂිතය | 1. වැලිපොතේහේන<br>2. ඇල්ගිරියෙ ගෙදර<br>3. දම්මණ්ඩිය ගෙදර<br>4. බැද්දවත්ත හේන<br>5. මැදහේන | 350m | 12 |
| 49. | සෙල්ලවත්ත පාර | කිරින්ද මගින් ඉහළ මධ්‍යම | මණ්ඩලාරාම විහාරස්ථානය ඉදිරිපිට | සෙල්ලවත්ත ඉඩම | සෙල්ලවත්ත ඉඩම | සෙල්ලවත්ත ඉඩම | 45m | 10 |
| 50. | මල්වත්ත පාර | හෙට්ටියාවල දකුණ | කිරින්ද-ගැටමාන්න පාර උඩහවලව් වත්ත ඉඩම අසලින් | මල්වත්ත ඉඩම | උඩහවලව්වත්ත ආර ඉඩම් | 1. ගුළුගහවත්ත<br>2. මල්වත්ත | 90m | 12 |

| අනු. අංකය | මාර්ගයේ නම | ග්‍රාම නිලධාරි වසම | ආරම්භය | අවසානය | වම්පස ඉඩම | දකුණු පස ඉඩම | පාරේ දිග | පාරේ පළල (අඩි ) |
|---|---|---|---|---|---|---|---|---|
| 51. | ඇටහින්න හන්දියේ මාර්ගයේ සිට සම්පත් නිවස ඉඩම දක්වා මාර්ගය | 327ඒ වතුකොළකන්ද උතුර | වතුකොළකන්ද 10 කණුව මාර්ගයේ ඇටහින්න හන්දිය | සම්පත් නිවස ඉඩම | 1. එච්. කේ. ලලිත් මයාගේ ඉඩම 2. ජී. ඒ. සුනිල් මයාගේ ඉඩම | 1. එච්. කේ. රුවනි නිලංගනී ගේ ඉඩම 2. ජී. ජී. යූ. වසන්ත මයාගේ ඉඩම | 25m | 10 |
| 52. | කෝංගහවත්ත පාර | 326සී මල්වතුගොඩ | කහවින්න පාරේ කෝංගහවත්ත ඉඩම අසලින් | කෝංගහවත්ත ඉඩම | අඹගහවත්ත ඉඩම | කෝංගහවත්ත ඉඩම | 35m | 10 |
| 53. | දෙල්ගහවත්ත පාර | 326ඒ ඕවිටිගමුව උතුර | ඕවිටිගමුව 12 කණුවේ සිට වැල්ලහේන ගල්කන්ද පාරේ ගල්දොළ අසලින් | දෙල්ගහවත්ත ඉඩමේ ඊ දරණ කැබැල්ල | 1. ගල්දොල 2. දෙල්ගහවත්ත ඉඩමේ ඒ, බී, සී. හා ඩී දරන කැබලි | 1. ගල්දොලමුල්ල කුඹුර 2. දෙල්ගහවත්ත ඉඩමේ ජී. ට්, අයි හා එෆ් අක්ෂර දරන කැබලි | 200m | 12 |
| 54. | බෙටිගහහේන පාර | 325 ඊ හෙට්ටියාවල නැගෙනහිර | කිරින්ද - ගැටමාන්න ප්‍රධාන මාර්ගයේ නුගහේන ඉඩම අසලින් | බෙටිගහහේන ඉඩම | 1. නුගේහේන 2. බෙටිගහහේන 3. ඇහැළගහහේන | 1. නුගේහේන 2. බෙටිගහහේන 3. ඇහැළගහහේන | 100m | 10 |
| 55. | අපරක්කේ ගෙදර පාර | 325 ඊ හෙට්ටියාවල නැගෙනහිර | පරණ මහපාරේ අපරක්කේ ගෙදර ඉඩම අසළින් | ජී. එම්. චතුර චාමින්ද මහතාගේ ඉඩම | 1. අපරක්කේ ගෙදර ඉඩමේ කැබලි කිහිපයක් | 1. අපරක්කේ ගෙදර ඉඩමේ කැබලි කිහිපයක් | 90m | 12 |
| 56. | එකමුතු මාවත | පුහුල්වැල්ල බටහිර | ඕවිටිගමුව දේවාලමුල්ල පාරේ දේවාල මුල්ල විදුහල අසලින් | තිරිගොන්නගහ වත්ත | දේවාලමුල්ල විදුහල | රුප්පෙගෙදර වත්ත | 100m | 12 |
| 57. | බස්නායක රුප්ප මාවත | 290 කරතොට | හෙට්ටියාවල කරතොට මාර්ගයේ බස්නායක රුප්ප ඉඩම අසලින් | බස්නායක රුප්ප ඉඩම | බස්නායක රුප්ප ඉඩමේ කොටස් කීපයක් | බස්නායක රුප්ප ඉඩමේ කොටස් කීපයක් | 90m | 12 |
| 58. | සුමිතුරු මාවත | පුහුල්වැල්ල නැගෙනහිර | සුහද මාවතේ කඩවැද්දුවගෙ වත්ත ඉඩම අසලින් | කඩවැද්දුවගේ වත්ත | උඩුගල්මොටේ ගෙදර ඉඩම | 1. කඩවැද්දුවගෙ වත්ත ඉඩම 2. උඩහගෙදර වත්ත | 50m | 14 |
| 59. | කිතුල් උයන උඩහහේන පාර | 325ඊ හෙට්ටියාවල දකුණ | කිතුල් උයන මාර්ගය | උඩහහේන ඉඩම | කිතුල් උයන උඩහහේන ඉඩමේ කොටස් කිහිපයක් | කිතුල් උයන උඩහහේන ඉඩමේ කැබලි කිහිපයක් | 200m | 12 |
| 60. | සුහද මාවත | 327 ඩී වතුකොලකන්ද නැගෙනහිර | අක්කර 100 පාරේ 70 හේන අසලින් | ගොඩගෙවත්ත ඉඩම | 1. තරිඳු සෙවන නිවස අයත් ඉඩම 2. ගොඩගෙවත්ත ඉඩම | 1. අමාදි නිවස අයත් ඉඩම 2. අංක 70 නිවස අයත් ඉඩම 3. දිමුතු සෙවන අයත් ඉඩම | 200m | 14 |

| අනු. අංකය | මාර්ගයේ නම | ග්‍රාම නිලධාරි වසම | ආරම්භය | අවසානය | වම්පස ඉඩම | දකුණු පස ඉඩම | පාරේ දිග | පාරේ පළල (අඩි) |
|---|---|---|---|---|---|---|---|---|
| 61. | උඩහ කෝපිවත්ත මාවත | පුහුල්වැල්ල නැගෙනහිර | පහළවත්ත පහළදෙනිය මාර්ගයේ උඩහ කෝපිවත්ත ඉඩම අසලින් | උඩහකෝපිවත්ත ඉඩම | උඩහකෝපිවත්ත ඉඩමේ කැබලි කීපයක් | උඩහකෝපිවත්ත ඉඩමේ කැබලි කීපයක් | 100m | 12 |
| 62. | පාත්‍රාගොඩ පාර | පුහුල්වැල්ල නැගෙනහිර | සමනමුල්ල පන්සල පාරේ ඇල්කනත්ත ඉඩම අසලින් | මහවත්ත ඉඩම | 1. ඇල්කනත්තේ ඉඩම 2. ගලහිටිය ගෙදර ඉඩම 3. පාත්‍රාගොඩ ඉඩම | 1. ඇල්කනත්ත ඉඩම 2. පාත්‍රාගොඩ ඉඩම | 250m | 12 |
| 63. | හොරගහවත්ත පාර | කිරින්ද මගින් ඉහළ දකුණ | මාතර හක්මන පාරේ අජිත් ටයර් වර්ක්ස් ස්ථානය අසලින් | හොරගහවත්ත ඉඩම | හොරගහවත්ත කැබලි අංක 07,08 05ඒ, 05බී | හොරගහවත්ත කැබලි අංක 04ඒ 04බී | 225m | 12 |
| 64. | කැකිරිවරාහේනවත්ත නොහොත් ගලගාව කොරටුවට යන මාර්ගය | 327ඩී වතුකොලකන්ද නැගෙනහිර | වලකන්ද පාරේ කඩේ ගෙදර කඩේ අසලින් | කැකිරිවරාහේන ඉඩම | අම්බලගාවදෙණිය කුඹුර | අම්බලගාවදෙණිය | 200m | 12 |
| 65. | දෙල්ගාහේන පාර | ඕව්ටිගමුව දකුණ | කිරින්ද- කඹුරුපිටිය මාර්ගයේ දෙල්ගාහේන ඉඩම අසලින් | දෙල්ගාහේන ඉඩම | දෙල්ගාහේන ඉඩමේ කැබලි අංක 03,10,09 11,12 | දෙල්ගාහේන ඉඩමේ කැබලි අංක 02,01,04,06 | 85m | 12 |
| 66. | වතුකොලකන්ද සුමුදු පෙදෙස පාර | වතුකොලකන්ද උතුර | කිරින්ද වලකන්ද පාරේ සුමුදු පෙදෙසේ 01 දරන ඉඩම් කොටස අසලින් | සුමුදු පෙදෙසේ අංක 06 හා 10 දරන ඉඩම් කැබලි | සුමුදු පෙදෙසේ අංක 01, 02, 04 06 දරන කැබලි | සුමුදු පෙදෙසේ අංක 07,08,09 10 දරන කැබලි | 100m | 12 |
| 67. | කිතලගම ගෙදර මාර්ගය | කිරින්ද මගින් ඉහළ මධ්‍යම | මැකිළියහේන පාර | කිතලගම ගෙදර | කිතලගම ගෙදර ඉඩම | කිතලගම ගෙදර ඉඩම | 11m | 12 |

08-461

---

**පොදු සුසාන භූමි සහ පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥා පනතේ 11 පරිච්ඡේදයේ 5(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වන නීතිඥ අතුල විජේසිංහ වන මා විසින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි පහත උපලේඛනයේ දැක්වෙන සුසාන භූමි පොදු සුසාන භූමි සහ පුද්ගලික සුසාන භූමි පිළිබඳ 1946 අංක 57 දරන ආඥා පනතේ 11 පරිච්ඡේදයේ 5(1) වගන්තිය යටතේ මලමිණී වැළලීම හා ආදාහනය කිරීම පිණිස පොදු සුසාන භූමියක් වශයෙන් ප්‍රකාශයට පත් කරමි.

නීතිඥ අතුල විජේසිංහ,
වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය.

2012 අගෝස්තු මස 03 වැනි දින,
වයඹ පළාත් සභාවේ දී.

*උපලේඛනය*

| | සුසාන භූමියේ නම | පිහිටීම | පිඹුරුපත් අංකය සහ දිනය | ඉඩමේ ප්‍රමාණය | මායිම |
|---|---|---|---|---|---|
| 1. | මරළුවාව බාබර්වත්ත පොදු සුසාන භූමිය | මරළුවාව | 2014/2007.09.04 | අ.0, රූ..03, ප.1 | *උතුරට* : ඩී. එස්. ද සිල්වා සහ අනිත් අය හිමිකම් කියන බාබර්වත්ත<br>*දකුණ* : මු.පි.කු/1638 කැබලි අංක 02<br>*නැගෙනහිරට* : දුම්රිය මාර්ගය හා රක්ෂිතය මු. පි. 2269<br>*බටහිරට* : මු.පි.කු/1638 කැබලි අංක 12/2 |
| 2. | බෝහිටියවත්ත පොදු සුසාන භූමිය | නයිලිය | 86/2008/2008.03.18 | අ.0, රූ..02, ප. 7.6 | *උතුරට* : ගම මැද පාර<br>*දකුණට* : ආර්. පී. ජයවර්ධනයේ ඉඩම<br>*නැගෙනහිරට* : එන්. ජී. ජයන්ත ගුණවර්ධනගේ ඉඩම<br>*බටහිරට* :ජේ. පී. චන්ද්‍රසේකරයේ ඉඩම |
| 3. | උඩදිගන පොදු සුසාන භූමිය | උඩදිගන | 194/2009.09.17 | අ.0, රූ. 02, ප. 8.48 | *උතුරට* : එම්. ඒ . සෝමාවතීගේ ඉඩම<br>*දකුණට* : එන්. ගුණරත්න හා එස්. එම්. නිමල් කරුණාතිලක හිමිකම් කුඹුර<br>*නැගෙනහිරට* : චන්ද්‍රා හේරත් හිමිකම් කියන ඉඩම<br>*බටහිරට* : එන්. ගුණවර්ධන හිමිකම් කියන ඉඩම |
| 4. | අත්තනපිටිය පොදු සුසාන භූමිය | අත්තනපිටිය | 145/2010/2010.08.17 | අ.0 ,රූ..01, ප. 16.1 | *උතුරට* : එස්. සෝමපාල හිමිකම් කියන ඉඩම<br>*දකුණට* : ජී. සිරිල් රත්නායක සහ තවත්අය හිමිකම් කියන ඉඩම<br>*නැගෙනහිරට* : තෙන්නකෝන් උඩගෙදර සහ තවත් අයට අයිති ඉඩම<br>*බටහිරට* : එස්. සිරිසේන සහ තවත් අය හිමිකම් කියන පවුලේ සුසාන භූමිය |

08-566

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.